# සිංගප්පූරු කොස් වැවීම.

———)o(———

කොස් වූකලී වවන්නට ඉතා පහසු වූ, එමෙන්ම ගම්බද දුප්පත් ජනතාවගේ ආහාරය වශයෙන් විශාල ලෙස අලෙවි වන්නාවූ දෙයකි. ධාන්‍ය අහේනි යෙන් අබලන්වූ ! අවස්ථාවලදී ඔවුන් සැපෙන්නේ මේ කොස්වලිනි. මෙය, ගෙඩියේ හැම අවස්ථාවකදීම ප්‍රයෝජනයට ගනු ලැබේ. ළපැටිවූ ගෙඩිය හෙවත් 'ගැට පොළොස' හීන් වෙන්නට ලියා මැල්ලුම් වශයෙනුත්, පැසුණු ගෙඩිය ලියා පොල්කිරි මිශ්‍ර කොට 'කිරිකොස්' වශයෙන් හෝ කොස් ඇටත් මිශ්‍ර කොට තම්බා සාමාන්‍ය ආහාර යක් වශයෙනුත් ගන්නා අතර, මේ ගෙඩිය ඉදුණු පසු පැණිවරකා වශයෙනුත් ප්‍රයෝජනයට ගනු ලැබේ.

සාමාන්‍ය කොස් පවුලට අයිතිවූ මේ 'සිංගප්පූරු' හෙරලිය, 'කලින් ගෙඩි හට ගන්නා'– පුදිත වර්ගයකි. එහෙත් 'ජොහෝර්' හෙරලිය වනාහි මීට හාත්පසින්ම වෙනස්වූ අන්‍ය උද්භිද ගණයකට අයත් වූවකි. සාමාන්‍ය කොස්වලින් මේ ජෝහෝර් හෙර ලිය වෙන්කර ගන්නට පුළුවන් ලකුණු කීප යක් ඇත. ජොහෝර් කොස් පැලයේ ලපටි කඳ පිඹිලි ආදියෙහි රළු දුඹුරු ලොම් දක්නට තිබේ. එසේම පැසුණු ගෙඩියෙන් 'ඩූරියන්' ගෙඩියේ සුවඳ වැනි උග්‍ර සුවඳක් හමයි. ගෙඩිය බොහෝවිට පුහුය. කුඩාය. කෑම වැඩිය උසස් නොවැඩේ. වෙළඳ ද්‍රව්‍ය යක් වශයෙන් ලියේ ඇති වැදගැම්මක් නැත්තේය.

පහතරට වර්ෂා කාලයේ, සිංගප්පූරු කොස් පිදෙන්ට ගතවන්නේ 18 මාසයකි. ඒ යහපත් කාලගුණ ආදිය ඇතිව ය. ඊට වඩා උස් ප්‍රදේශවල නම් මෙය අවුරුදු 2 දක්වා දීර්ඝවන්ට පුළුවන. නොවැම්බර් හා පෙබරවාරි අතර අවාරයේදී මේ ගෙඩි වර්ගය විශාල වශයෙන් පැසේ. මේ කොස් දෙවර්ගය සාමාන්‍ය කොස් හා සමග වගා කිරී මත් මුළු අවුරුද්ද පුරාම කොස් ගෙඩි ලැබිය හැකි වන්නේය. මෙම ගෙඩිය බොහෝ වශයෙන් ඉදෙන්නේ වරකාවව ය. එහි ඇට වලින් බෝවන්නාවූ ගස්වලින් ඇතැම් විට 'වැල' ලැබෙන්නට පුළුවන. බොහෝවිට මෙම වර්ගයේ බෝවීම්වල මුල් ගසේ ගති ගුණම විද්‍යමාන නොවන බැවිනි.

## ඇට සිටුවීම.

කොස් ඇටය සුළං වැදෙන්නට තිබුණු විට, පැළවීමේ ශක්තිය එම ඇටයෙන් ඉක්මනට තුරන් වන්නේය. එහෙයින් සිටු වන්නට තෝරාගත යුත්තේ ගෙඩියෙන් ගලවා ගත් හැටියේ ඇටය. ගෙඩියෙන් ගලවාගත් පසු සිටුවනතෙක් මේ ඇට කොහුබත් හෝ වැලි අතර තැන්පත් කර තැබිය හැකි නමුත් කොස් ඇටයේ මූලික පත්‍ර වශයෙන් වැඩෙන කොටස වියලී දෙදරීගියහොත් කොස් ඇටය පැළවීම උගහටය.

පොල් ලෙල්ලක කොස්ඇටය වැසෙන පමණට පස් දමා පොල්ලෙල්ලේ කොස් ඇටය පැලවූවිට, එම පොල්ලෙල්ලත් සමග පොළොවේ සිටුවීම කොස් සිටුවීම සාර්ථක කර ගත හැකි සතුටුදායක මාර්ගයකි. කුඩා උණ බම්බු පෝච්චිවල හෝ පැල වගා කරන කූඩා වලත් මෙවා මුල් ඇද්දවීය හැකිය. එහෙත් එම බඳුන්වල මාසයකට වඩා මේ පැල සතුටුදායක ලෙස නොවැඩේ. කොස්ඇට පාත්තිවල තවාන් කරන්නේ නම්, මූලික පත්‍රවල ආහාර නොවැස් නිමා වන්නට පළමු ඒවා උදුරා ඉන්දවිය යුතුයි. එසේ නොකළ හොත් පැලය ඉගිල්ලීමේදී ඇතිවූ ආබාධයෙන් පැලය මියයන්නට පුළුවන් නිසාය.

## පැල සිටුවීම.

මේ සඳහා විසිතුරු ලෙස පිළියෙල කළ වළවල් ඕනෑ නැත. වළක ප්‍රමාණය අඩි $1\frac{1}{2} \times 1\frac{1}{2}$ ක් විය හැකිය. වළ මත පස් මිශ්‍ර

ණයකින් හා (තිබේ නම්) කුණු පෝර හෝ වියලි ගොම පෝර පිකකින් පිරවිය යුතුයි. මේ සිටුවීම කළ යුතු හොඳම කාලය නම වර්‍ෂා කාලයේ මුලාරම්භයේ ඇතිවන පුළු වැසි සහිත කාලයයි. සිටවූ විගසම වියලි කාලයක් ලැබුව හොත්, පැලය මනාසේ සුබිත තත්වයකට එනතුරු ජලය ඇද හෝ වත් කළ යුතුයි.

සාමාන්‍යයෙන් කොස් සිටුවිය යුත්තේ පැලයක සිට තවත් පැලයකට දුර අඩි 25 ක් වන ලෙසට ය. සුළඟට ආවරණයක් වන හැටියට ගස් සිටුවීම අවශ්‍ය වුවහොත් පැලයක සිට පැලයකට දුර අඩි 18 ක් වන ලෙස සිටුවිය හැකියි. එසේවූ විට එක පේලියක පැල අනික් පේලියේ පැල මැදට එන සේ සිටුවිය යුතුයි.

කුඩා කාලයේදී කොස් ගෙඩිය කොස් කුරුම්ණියාගේ අනතුරට භාජනවන්නට ඉඩ තිබේ. මේ කුරුම්ණියා කළඑළි බසින්නේ එම මවු ඉපියා විසින් කොස් කටුවේ දමනු ලබන බිත්තරයකින් ජනිත වන දළඹුවෙකුගෙනි. කටුවේ මුලෝත්පත්තිය ලබන මේ සත්වයා කටුව පසා කර ගෙන අනුක්‍රමයෙන් ගෙඩියේ මැදට හා වදින්නේය. මේ සත්වයා විසින් අනතුරු කරනු ලැබූ තැන ගෙඩී රෝග පතුරුවන වෙනත් විෂබීජයන්ගේ හේතුවෙන් දුෂිත වන්නටත් කුණුවෙන්නටත් පටන් ගන්නේය. හටගන්නා අලුත් ගෙඩි කුඩාවලින් වැසීමෙන් හෝ ඒවාට 'ගැමෙක්සින්' කුඩු ඉසීමෙන් මේ අනතුර පිටු දක්ක හැකි වන්නේය.

කොස්ගෙඩි කඩන විට නැට්ට ගසේ ඉතිරි වෙන්ට නොකඩනු. ගෙඩිය නැට්ටත් එක්ක එක එල්ලේම කඩා හැරීමෙන්, ලබන වාරයේ පල දරණ අතු රිකිලි ඇදීමට එම සිදුරු ප්‍රයෝජනවත් වන්නේය.

## බඩ කරන ලද කොස්.

ඉහත මෝසමේ පල දුරු අංකුර බඩ කිරීමෙන්, කෘෂිකර්ම නිලධාරීන් විසින් අනුමත කරන ශාස්ත්‍රානුකූල ක්‍රමයට කොස් පැල බඩ කරන්නට පුළුවන. එහෙත් බඩ කරන ලද පැල ඉන්දවීම අපහසුය. එසේම ඇට සිටුවා පැලකරන ලද ගස්වලට අවශ්‍ය වන කාලය හා සමාන කාලයක් පල දරන්නට ඕනෑ කරයි. බඩ කිරීමේ ඇති එකම ප්‍රයෝජනය නම්, අං පැලය මවු පැලයේ ගතී ගුණම දැරීමයි. බඩ කරන ලද ගස්වල අතු පතර ඇදීම ආදිය ඉතා පහසින් සිදු වන බැවින්, වෙළඳම සඳහා එකී ලීයේ ඇති වැදගැම්මකුත් නැත්තේ ය.